ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>සාගර් බන්ධු මෙහෙයුම: මහියංගනයේ ඉන්දීය හමුදා ක්ෂේත්‍ර රෝහල ශ්‍රී ලංකාවේ සිය ක්‍රියාන්විතය අවසන් කරයි</u>

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ දැඩි විනාශය සහ සේවා ඇණහිටීම් හමුවේ සාගර් බන්ධු මෙහෙයුම යටතේ අංග සම්පූර්ණ ක්ෂේත්‍ර රෝහලක් සහ ඉන්දීය හමුදාවේ ශත්‍රුජිත් සේනාංකයේ ඒකාබද්ධ කාර්ය සාධක බලකායේ 78 දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය කණ්ඩායමක් 2025 දෙසැම්බර් 2 වන දින ගුවන් මගින් ශ්‍රී ලංකාවට රැගෙන එන ලදී. මෙම රෝහල මහනුවර ආසන්නයේ මහියංගනය ප්‍රදේශයේ ස්ථාපනය කරන ලද අතර එහි අරමුණ වූයේ ප්‍රදේශයේ හදිසි වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමයි. ඉන්දියාවේ මානුෂීය සහය සහ ආපදා සහන ප්‍රයත්නයන්හි ප්‍රධාන අංගයක් වූ මෙම රෝහල මගින් ආපදා සහන ප්‍රතිකාර, ශල්‍යකර්ම සහ සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාර ඇතුළු අත්‍යාවශ්‍ය ජීවිත සුරැකීමේ සහය ලබා දෙමින් දෛනිකව රෝගීන් 1,000 – 1,200කට පමණ සේවය සලසන ලදී.

2. වඩාත්ම බලපෑමට ලක්වූ ප්‍රදේශයන්හි ජනතාවට සහනය ගෙන දෙමින් රෝහල ක්‍රියාත්මක වූ කාලය තුළ රෝගීන් 7,176 දෙනෙකුට ප්‍රතිකාර ලබා දුන් අතර සුළු වෛද්‍ය ක්‍රියාකාරකම් 513ක් ද ප්‍රධාන ශල්‍යකර්ම 14ක් ද සිදු කරන ලදී. දෙසැම්බර් 12 වන දින ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා සහ ඌව පළාත් ආණ්ඩුකාර ගරු කපිල ජයසේකර මැතිතුමා රෝහල වෙත ගොස් එහි කටයුතු නිරීක්ෂණය කළහ.

3. 2025 දෙසැම්බර් 10 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) ආයතනයේ ඉල්ලීම පරිදි ඉන්දීය කණ්ඩායම විසින් ඔප්ටික් ෆයිබර් කේබල් (OFC) පද්ධතිය යළි සම්බන්ධ කරමින් මහියංගනය ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය සන්නිවේදන ජාලයක් ද යථා තත්ත්වයට පත් කරන ලදී. ගසක් කඩා වැටීම හේතුවෙන් OFC කේබල්වලට හානි වී විශාල ප්‍රදේශයක සන්නිවේදනය ඇණ හිට තිබිණ. සම්බන්ධතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඉන්දීය හමුදා කණ්ඩායම විසින් මහියංගන රෝහල සමීපයේ පිහිටා ඇති BTS කුලුණ අසල OFC කේබල් තාක්ෂණික නිරවද්‍යතාවයෙන් යළි සම්බන්ධ කරන ලදී.

අභියෝගාත්මක කාලගුණික තත්ත්වයන් සහ දුෂ්කරතා ජය ගනිමින්, කණ්ඩායම සාමාන්‍ය ජාල මෙහෙයුම් යළි ක්‍රියාත්මක වීමට අවකාශ සලසමින් අත්‍යාවශ්‍ය සන්නිවේදන ජාල යථා තත්ත්වයට පත් කරන ලදී.

4. ක්‍රියාන්විතය සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව ක්ෂේත්‍ර රෝහලේ කටයුතු නිමාවට පත් කරමින් වෛද්‍ය කණ්ඩායම දෙසැම්බර් 14 වන දින ඉන්දීය ගුවන් හමුදාවේ C17 ග්ලෝබ්මාස්ටර් ගුවන් යානයක් මගින් කොළඹ සිට ඉන්දියාව බලා පිටත් විය. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමක් අනුව මෙම ගුවන් යානයෙන් අත්‍යාවශ්‍ය ඖෂධ ටොන් 10ක් සහ වියළි සලාක ටොන් 15ක් ද ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. වෛද්‍ය කණ්ඩායම දිවයිනෙන් සමුගන්නා අවස්ථාවට එක්වීම සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට පැමිණි අතර එතුමා සඳහන් කළේ මෙම ක්ෂේත්‍ර රෝහල මිත්‍රශීලි රටක් විසින් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද විශාලතම ක්ෂේත්‍ර රෝහල බවයි. එමගින් අර්බුදකාරී අවස්ථාවේදී ඉන්දියාව විසින් ලබා දෙන කඩිනම්, ඵලදායි සහ මහා පරිමාණ මානුෂීය සහය අවධාරණය කෙරෙන බව එතුමා පැවසීය. අමාත්‍යතුමා ඉන්දියාවේ කාලෝචිත සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ කෘතවේදිත්වය ද පළ කළේය.

5. දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ට අවශ්‍ය ගුණාත්මක වෛද්‍ය සහය ලබා දුන් මෙම ක්ෂේත්‍ර රෝහල ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉන්දියාවේ කැපවීම සහ මිත්‍රත්වය සඳහා සාක්ෂියයක් වේ.

***

කොළඹ
2025 දෙසැම්බර් 14